// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1961/7 - 2016 අප්‍රේල් මස 05 වැනි අඟහරුවාදා - 2016.04.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු නිවේදනය

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 25 වැනි වගන්තියෙන් ගරු මුදල් අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2015.12.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි පනවන ලද අංක 1945/17 දරන 2015.12.15 දිනැති ගැසට් නිවේදනයෙහි සඳහන් වූ පහත දක්වෙන නියමය 2016.03.10 දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එච්. එස්. සමරතුංග,
ලේකම්,
මුදල් අමාත්‍යාංශය.

2016 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

නියමය

2008 අප්‍රේල් මස 10 වැනි දින අංක 1544/17 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 902 වන නිවේදනය මේ නියමය මගින් පහත දක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :-

(1) එකී නිවේදනයට පහත දක්වෙන 1 වන උපලේඛනය ඇතුළත් කිරීමෙන්.-

1 වැනි උපලේඛනය

| *I වැනි තීරය* | | *II වැනි තීරය* | |
|---|---|---|---|
| | *බලපත්‍රයේ ස්වභාවය හෝ විස්තරය* | *වාර්ෂික බලපත්‍ර ගාස්තුව රුපියල්* | *ඇපය රුපියල්* |
| 1 | ස්කාගාර බලපත්‍රය | | |
| | (i) ස්කාගාර බලපත්‍රය (තල් අරක්කු හැර) | 100,000,000 | 25,000 |
| | (ii) ස්කාගාර බලපත්‍රය (තල් අරක්කු) | 2,50,000 | 25,000 |

1A - PG 2916 — 106 (2016/04)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1 වැනි උපලේඛනය (සම්බන්ධිතයි)

| *I වැනි තීරය* | | *II වැනි තීරය* | |
|---|---|---|---|
| | *බලපත්‍රයේ ස්වභාවය හෝ විස්තරය* | *වාර්ෂික බලපත්‍ර ගාස්තුව (රුපියල්)* | *ඇපය රුපියල්* |
| 2 | නිෂ්පාදකයින්ගේ තොග වෙළඳ අරක්කු/බියර්/විදේශීය මත්පැන් බෙදාහැරීමේ බලපත්‍රය | 10,00,000 | 50,000 |
| 3 | රා බෝතල් ගත කිරීමේ බලපත්‍රය | 10,00,000 | - |
| 4 | විනාකිරි නිෂ්පාදනාගාර බලපත්‍රය | 5,00,000 | - |
| 5 | මත්පැන් සඳහා තොග වෙළඳ බලපත්‍රය (ර.බී.3) | 10,00,000 | 50,000 (අරක්කු සඳහා පමණක්) |
| 6 | මත්පැන් සඳහා සිල්ලර බලපත්‍රය (ර.බී.4) | | |
| | 1. මහ නගර සභා ප්‍රදේශ | 6,00,000 | 25,000 |
| | 2. නගර සභා ප්‍රදේශ | 4,00,000 | 25,000 |
| | 3. අනෙකුත් ප්‍රදේශ | 3,00,000 | 25,000 |
| | 4. ඉල්ලුම්කාර ව්‍යාපාරයේ/සමාගමේ හෝ එහි මව් ව්‍යාපාරයේ/සමාගමේ වාර්ෂික පිරිවැටුම රුපියල් දසලක්ෂ 72 ඉක්මවන වෙළඳ සංකීර්ණ/ වෙළඳසල් වැනි ආයතන සඳහා ඒවා පිහිටි ප්‍රදේශ නොසලකා දෙනු ලබන මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍රය | 10,00,000 | 25,000 |
| 7 | හෝටල් බලපත්‍රය (ර.බී.7) සංචාරක මණ්ඩලය අනුමත කරනු ලැබූ සහ සංචාරක මණ්ඩල අනුමැතිය රහිත හෝටල් කාමර 05 හෝ ඊට වැඩි | | |
| | (i) කාමර 200ක් හෝ ඊට වැඩි | 10,00,000 | 25,000 |
| | (ii) කාමර 20 සිට 199 දක්වා | 5,00,000 | 25,000 |
| | (iii) කාමර 20ට අඩු | 3,00,000 | 25,000 |
| 8 | හෝටල් පීඨිකා බලපත්‍රය (ර.බී.8) | 1,00,000 | - |
| 9 | විකුණන වේලාවන් දීර්ඝ කිරීමට අතිරේක බලපත්‍රය (සතියකට) (ර.බී.15) | 75,000 | - |
| 10 | හෝජනාගාර බලපත්‍රය (සංචාරක මණ්ඩලය අනුමැතිය සහිත/අනුමැතිය රහිත) (ර.බී.11) | 6,00,000 | 25,000 |
| 11 | සම්භාෂණ හා විනෝද කාර්යයන් සඳහා වන සමාජශාලා, ක්‍රීඩා සමාජ හා සාමාජිකයින් සඳහා පමණක් වන සමාජශාලා සඳහා වූ බලපත්‍රය (ර.බී.13ඒ) | 6,00,000 | 25,000 |
| 12 | හිමිකාර සමාජශාලා බලපත්‍රය (ර.බී.13) | 8,00,000 | 25,000 |
| 13 | තානායම් බලපත්‍රය (ර.බී.12) | 3,00,000 | 25,000 |
| 14 | සිනමා සඳහා විනෝද පීඨිකා බලපත්‍රය (ර.බී.9) | 3,00,000 | 25,000 |
| 15 | (i) බියර්,ඒල්, ස්ටවුට් හා වයින් විකිණීම සඳහා විශේෂ බලපත්‍රය (සිල්ලරට විකිණීම) (ර.බී.22ඒ) | 1,00,000 | 25,000 |
| | (ii) ස්ථානීය පරිභෝජනය (ර.බී.22බී) (සංචාරක මණ්ඩල අනුමැතිය සහිත/ අනුමැතිය රහිත) | 1,50,000 | 25,000 |
| 16 | වතු ආපන ශාලා | 1,00,000 | 25,000 |
| 17 | රා එකතු කිරීමේ ස්ථාන බලපත්‍රය | 1,00,000 | - |
| 18 | දුම්රිය හෝජනාගාර (ර.බී.10) | 50,000 | 25,000 |

1 වැනි උපලේඛනය (සම්බන්ධිතයි)

| *I වැනි තීරය* | | *II වැනි තීරය* | |
|---|---|---|---|
| | *බලපත්‍රයේ ස්වභාවය හෝ විස්තරය* | *වාර්ෂික බලපත්‍ර ගාස්තුව (රුපියල්)* | *ඇපය රුපියල්* |
| 19 | පරිපාක ස්ප්‍රීතු විකිණීම (ර.බී. 17)/ඊතයිල් මද්‍යසාර විකිණීම | 50,000 | 25,000 |
| 20 | බෝතල් කිරීමට බලපත්‍රය | 50,000 | - |
| 21 | ගබඩා සහ ගුදම් බලපත්‍රය | 50,000 | - |
| 22 | අවස්ථා බලපත්‍රය (දිනකට) (ර.බී.14) | 50,000 | - |
| 23 | වෙන්දේසිකරුවන්ගේ බලපත්‍රය (දිනකට) (ර.බී.16) | 50,000 | - |
| 24 | පානීය නොවන ස්ප්‍රීතු ආනයනය හා ළඟ තබා ගැනීම සඳහා දෙනු ලබන බලපත්‍රය | 50,000 | - |
| 25 | කිරිපොන්සා හෝ වයින් නිෂ්පාදනය, බෝතල්ගත කිරීම සහ විකිණීම සඳහා දෙන බලපත්‍රය | 5,000 | - |
| 26 | ඕනෑම තාල වර්ගයේ ගසකින් ලබා ගන්නා ස්වභාවික ද්‍රව්‍ය හෝ වෙනත් පැලෑටි වලින් හෝ ආසවනය කිරීම හැර වෙනත් ක්‍රියාවලියකින් රා හැරෙන්නට ධාන්‍ය වලින් සෑදූ මද්‍යසාර 4% පරිමාවට වඩා අඩංගු නොවන මත්පැන් නිෂ්පාදනය කිරීමට දෙන බලපත්‍රය | | - |
| 27 | ඕනෑම තාල වර්ගයේ ගසකින් ලබා ගන්නා ස්වභාවික ද්‍රව්‍ය හෝ වෙනත් පැලෑටි වලින් හෝ ආසවනය කිරීම හැර වෙනත් ක්‍රියාවලියකින් රා හැරෙන්නට ධාන්‍ය වලින් සෑදූ මද්‍යසාර 4% පරිමාවට වඩා අඩංගු මත්පැන් නිෂ්පාදනය කිරීමට දෙන බලපත්‍රය | 5,000 | - |
| 28 | ටී සයිඩර් නිෂ්පාදනය සඳහා දෙන බලපත්‍රය | 5,000 | - |
| 29 | ඖෂධීය ස්ප්‍රීතු විකිණීම (ර.බී.18) | 5,000 | - |
| 30 | වයින් ස්ප්‍රීතු විකිණීම | 5,000 | - |

| | *බලපත්‍රයේ ස්වභාවය හෝ විස්තරය* | *බලපත්‍ර ගාස්තුව* |
|---|---|---|
| 31 | තොග වශයෙන් පදම්කල අරක්කු නිෂ්පාදනය සහ විකිණීම සඳහා සහ නිෂ්පාදනය සහ තොග වෙළඳසල්වලට නිකුත් කිරීම සඳහා වන බලපත්‍රය | රු. 50,000,000 (රුපියල් මිලියන පනහකි) (31-35) |
| 32 | තොග වශයෙන් ඉක්ෂුපාක අරක්කු නිෂ්පාදනය සහ විකිණීම සඳහා වන නිෂ්පාදනය සහ තොග වෙළඳසල්වලට නිකුත් කිරීම සඳහා වන බලපත්‍රය | |
| 33 | තොග වශයෙන් විශේෂ අරක්කු නිෂ්පාදනය සහ විකිණීම සඳහා සහ නිෂ්පාදනය සහ තොග වෙළඳසල්වලට නිකුත් කිරීම සඳහා වන බලපත්‍රය | |
| 34 | තොග වශයෙන් පොල් අරක්කු නිෂ්පාදනය සහ විකිණීම සඳහා සහ නිෂ්පාදනය සහ තොග වෙළඳසල්වලට නිකුත් කිරීම සඳහා වන බලපත්‍රය | |
| 35 | තොග වශයෙන් මෙරට සෑදූ විදේශ මත්පැන් නිෂ්පාදනය සහ විකිණීම සඳහා සහ නිෂ්පාදනය සහ තොග වෙළඳසල්වලට නිකුත් කිරීම සඳහා වන බලපත්‍රය | |
| 36 | තොග වශයෙන් ධාන්‍ය මත්පැන් නිෂ්පාදනය සහ විකිණීම සඳහා සහ නිෂ්පාදනය සහ තොග වෙළඳසල්වලට නිකුත් කිරීම සඳහා වන බලපත්‍රය | රු. 50,000,000 (රුපියල් මිලියන පනහකි) |
| 37 | තොග වශයෙන් තල් අරක්කු නිෂ්පාදනය සහ විකිණීම සඳහා සහ නිෂ්පාදනය සහ තොග වෙළඳසල්වලට නිකුත් කිරීම සඳහා වන බලපත්‍රය | රු. 5,00,000 (රුපියල් ලක්ෂ පහකි) |

(2) එම නිවේදනයේ III වන උපලේඛනය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ :-

*(අ)* 5 වැනි ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

''5. අලුත් බලපත්‍රයක් සඳහා හෝ බලපත්‍රය අලුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමේ දී ආපසු නොගෙවන රුපියල් දස දහසක (රු. 10,000) ඉල්ලුම් පත්‍ර ගාස්තුවක් ගෙවනු ලැබිය යුතු ය.''

*(ආ)* 6 වැනි ඡේදය ඉවත් කර සහ පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

''6. සෑම බලපත්‍රයක්ම වසරක කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය. වසර මැද දී නිකුත් කරනු ලබන බලපත්‍රයක් වසරේ ඉතිරිව පවතින කාලසීමාව සඳහා නිකුත් කරනු ලැබිය යුතු ය.''

*(ඇ)* 7 වැනි ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

''7. සුරාබදු ආඥාපනත යටතේ නිකුත් කළ සෑම බලපත්‍රයක්ම 1 වන උපලේඛනයේ දක්වා ඇති බලපත්‍ර ගාස්තුවට යටත් විය යුතු අතර වර්ෂයෙන් අඩක කාලසීමාවක් වෙනුවෙන් නිකුත් කරන අලුත් බලපත්‍රයක් සම්බන්ධයෙන් ඒ ගාස්තු සමානුපාතික පදනමක් මත අයකර ගනු ලැබිය යුතු ය. අදාළ මුදල් වර්ෂය ආරම්භ වන දිනයට යටත් පිරිසෙයින් වැඩ කරන දින හතකට පෙරාතුව ගෙවීම් සිදු කළ යුතු ය. එසේ වුව ද මුදල් වර්ෂය ආරම්භ වී යටත් පිරිසෙයින් වැඩ කරන දින හතක් ඇතුලත අදළ ප්‍රාදේශීය ලේකම්වරයා ඒ ගාස්තු මුදල ලැබී නොමැති නම් ඒ බලපත්‍ර ගාස්තුවේ 1%ක දඩයකට යටත්ව සති හතරක කාලසීමාවක් ඇතුළත ඒ ගෙවීම් සිදු කිරීමට අවසර ලබා දිය යුතු ය. සති හතරක කාලසීමාව ගත වූ පසුව දඩය බලපත්‍ර ගාස්තුවේ වටිනාකමෙන් 3%ක් විය යුතු ය.

*(ඈ)* 27 වැනි ඡේදයේ රු. 7,500/- යන වචන හා ඉලක්කම් ඉවත් කර ඒ වෙනුවට රු. 10,000/- යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්,

*(ඉ)* එකී නිවේදනයේ III වන උපලේඛනයේ 28 වැනි ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්,

''28. බලපත්‍ර පැවරීම හා ස්ථාන මාරු කිරීමේ සඳහා වූ ඉල්ලුම්පත්‍ර ගාස්තු වෙනුවෙන් වූ මුදල රු. 10,000/-

*(ඊ)* 3 වැනි උපලේඛනයේ සඳහන් නිවේදනයේ 29 වැනි ඡේදය ඉවත් කර පහත ඡේදය ආදේශ කිරීමෙන් :-

''29. පැවරුම්ලාභියා පැවරුම්කරුගේ නීත්‍යානුකුල උරුමකරු නොවන අවස්ථාවක බලපත්‍ර පැවරීම සඳහා වන ගාස්තුව පහත දැක්වෙන පරිදි විය යුතු ය.

| | | |
|---|---|---|
| *(අ)* | ර.බී. 4 වර්ගයේ මත්පැන් බලපත්‍ර සඳහා ගාස්තුව | රු. 1,50,00,000 |
| *(ආ)* | වෙනත් මත්පැන් බලපත්‍ර සඳහා ගාස්තුව | රු. 15,00,000 |

04-805/1

---

## සුරාබදු නිවේදනය

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 25 වැනි වගන්තියෙන් ගරු මුදල් අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2010 නොවැම්බර් මස 19 දිනැති අංක 1680/24 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද අංක 926 දරන සුරාබදු නිවේදනය සහ 2015 පෙබරවාරි මස 13 දිනැති අංක 1901/19 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 974 දරන සුරාබදු නිවේදනය 2015.12.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කිරීමට පනවන ලද නියමය (2015 දෙසැම්බර් මස 15 දිනැති 1945/17 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද අංක 984 දරන සුරාබදු නිවේදනය) 2016.03.10 දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එච්. එස්. සමරතුංග,
ලේකම්,
මුදල් අමාත්‍යාංශය.

2016 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

04-805/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.